





ංඅෑ ?
නෑ !
බෑ ?
මොකක්ද කිව්වේ ? පන්හිඳ ඇහුවා.
මොකුත් නෑ ! පින්සල කිව්වා.

පැහී තිබිණ. පුංචි අන්දරේගේ මවගේ භූමිකාව රඟ පෑ දැරිය අපගේ බස් වහර කදිමට උසුරු වන්නී වරෙක රුහුණට හුරු ආකාරයෙන් ද වරෙක උඩරටට හුරු ආකාරයෙන් ද දෙබස් ඉදිරිපත් කළාය. සියළුම දරුවන්ගේ උච්චාරණය සිංහලකම රකිමින් ඉහළ මට්ටමක පැවතිණ. ගායනා වෘන්දය ද සිය වගකිම නොපිරිහෙලා ඉටු කළහ. "කතාහාමි" චරිතය පණ පෙවූ දැරියද ඉතා ආකර්ශනීය ලෙස සිය ගායනා හා රංගනයන් ඉදිරිපත් කළ බව වෙසෙසින් ලිවිය යුතුය.

මෙවන් මිණිකැට පෙළක් ඔප ගැන්වීම පිළිබඳව මුළු මහත් සිංහල සමාජයම කුසුම්සිරි, යශෝදරා දෙපළට කෘතවේදී විය යුතුයි. ඉතා හොඳ අංග නිවහල්, නිරවුල්, නිර්ව්‍යාජ, නිරහංකාර මනසකින් යුත් දූ දරුවන් ඔපවත් කරනා තවත් ආයතන ය දහම් පාසල් හා සිංහල භාෂා පාසල්. දහමට බසට අමතරව සිය සිසුන් වේදිකා ගතකරවන්නට ද උනන්දු වන්නෝය මේ ගුරු දෙමාපියෝ.

බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසල් කමිටුවේ ගරු සභාපති ජානක වීරක්කොඩි මහතාගේ ඇරයුමට අනුව එකී පාසල් සිසුන්ගේ හපන්කම් ද දැකගන්නට වරම් ලැබුවෙමු අපි.
පළමු වසරේ සිසුන් ඉදිරිපත් කළ පූජා නැටුමෙන් පසුව ඉදිරිපත් කළ "බෙර හඬ" විවිධ ප්‍රසංග ආරම්භයේදීම සිත් ප්‍රබෝධ කරවන්නක් වීය. තම්මැට්ටම්, දවුල්, පන්තේරු හා තාලම්පට වයමින් කුඩා දරුවන් කළ හපන්කම් ඇගයීමට ලක් විය යුතුයි.

"ලබුගෙඩියේ යාගය", "පාන තියා බුදු සාදුට" වැනි අංගද එකිනෙකාට නොපරයන නිර්මාණාත්මක අංගයන් වීය. "සින්දුවට නැටුමක්" හා "කහ මල් ඉත්තක්" ඉදිරිපත් කළ සුරතල් දූ දරුවන්ගේ හපන්කම් ද අමතක කළ නොහේ. වේදිකා පසුතල හා සමරුවේ කවරය දරුවන්ගේ චිත්‍රවලින් නිර්මාණය කිරීම ද ප්‍රශංසනීයයි. විවේක කාලයේදී තවත් දරුවෙකුගේ ම කටයුත්තක් සඳහා පිටත්වීමට සිදු වූයෙන් ඉන් පසු ඉදිරිපත්වීමට තිබූ අංග හත රසවිඳීමට නො හැකි වීම පිළිබඳව කණගාටු වන්නෙමු.

කෙසේ වුවද විදුහල්පති ජයන්ත වන්නිආරච්චි මහතා ප්‍රමුඛ ගුරු මණ්ඩලයේත්, දෙමාපිය භාරකාරාදීන්ගේත් අප්‍රතිහත ධෛරය හමුවේ අවදි වූ යුරෝක් ප්‍රාදේශීය මන්ත්‍රිනී ලීස් බීටි (LIZ BEATIE) මහත්මිය සිය සමාරම්භක කථාව නිමා කළේ මූල්‍යමය ප්‍රතිපාදනයක් ද ප්‍රධානය කරමිනි.

# දේව විස්තර



මොකුත් නැති වෙන්න බෑ පැන්සල ආයෙත් ඇහුවා.

"නෑ මං කිව්වේ හෝදන්න තව රෙදි තියේනං වොෂින් මැෂින් එකට දාන්න...." පින් පන්ගෙයි පැන්ගෙයි කිළිටි ඇඳුම් හොයනවා හෝදන්න දාන්න.

"අපි කිළිටි ඇඳුම් දාලයි තියෙන්නේ. තව මොනවද ඔය හොයන්නේ ?" පැන් ඇහුවා. "වොෂින් මැෂින් එකට රෙදි දානකොට එක වඩියකට හරියන බර වැටෙන්න දාන්න ඕන. නිකං අපරාදේ මැසිම රෙද්දකට දෙකකට කරනවන්නේ."

"ඉතින් ඔය ගිය සති අන්තෙ හේදුවාට පස්සේ තවම ඇන්දෙත් නැති රෙදිනෙ ආයෙත් දාන්න හද්නනේ." පන්ට හිනා. තිබුණ තැනින්ම අඩුක් කළා.
"මගේ දේව විස්තරේ නං ගිය සතියෙ හෝදන්න බැරිවුණා." පන් විහිළුවට වගේ කිව්වා.

"කිළුටු නං දාන්න. කොහෙද තියෙන්නෙ ? පින් ඒ කතාව දන්නෙ නෑ. මොකද ? කුසුම්සිරි ලියනාරච්චි, යශෝදරා සරච්චන්ද්‍ර දෙපළගේ "දේව වස්ත්‍රය" නාට්‍ය බලන්න පින්ට යන්න බැරි වුණා. පින්ට එදා ඕ. ටී. එකක් වැටිලා.

"දේව වස්තරේ මෝඩයින්ට පේන්නෙ නෑ" පැන් කිව්වා "ජන්ක් මේල්" දාලා ගැට ගහගත්ත ඩොලර් ටිකක් වියදම් කරලයි පැන් පින්ට එකතු වුණේ ළමයින්ගේ කියුම් කෙරුම් බලන්න තියෙන ආසාවට. "දේව වස්ත්‍රයත්" එක්ක "පුංචි අන්දරේ" වේදිකා නාට්‍යයක් රඟදැක්වුණා. ඇත්තටම තවම රස්සාවකුත් නැතිව කාංසියෙන් ඉන්න පැන්ට හරි සතුටුයි එදා හවස නාට්‍ය බලන්න යන්න ලැබුණ එකකට.

"ලියනවලකො මොනවා හරි ඔය ගැන..." පින් කතාව අහන් ඉඳලා කිව්වා.
"ඇත්තට ම මං කොල කෑල්ලකුයි පෑනකුයි අරගෙනමයි ගියේ. මොනවවත් ලියාගන්නවත් ඇහැ අහකට ගන්න අමතක වුණා." පන් වෙනදටනම් කරුවලේම මොනවා හරි කුරුටු ගා ගන්නවා.

මෙල්බර්න් නුවර අප අතර වෙසෙන කුඩා දූ දරුවන්ගේ අපූරු හපන්කම් එකතුවකි "පුංචි අන්දරේ" වේදිකා නාට්‍යය. පුංචි අන්දරේ චරිතය පණ පෙවූ දරුවා ඇතුළු සියළුම දරුවන් විවිධ අන්දමින් සිය භූමිකාවන් රඟ දැක්වූ අයුරුත්, ගායනාවන් ඉදිරිපත් කළ අයුරුත් අතිශයින් ම සිත් ගන්නා සුළු වීය. වරෙක චාලි චැප්ලින් සිහි ගැන්වූ පුංචි අන්දරේගේ මුහුණුවර, කොණ්ඩය සකස් කර තිබුණු ආකාරය ගමන " බිමන ඇඳුම් පැළඳුම් යන සියල්ල ඔහුගේ මුබරිකමට හා ඔහුගේ රංගන කුසලතාවයන් ට මොනවට

රචනයකින් සහ වේෂ නිරූපනයකින් යුතු වුවද ඇඳුම් සැකසීමේ දී යුරෝපීය කබායට හුරු ඇඳුමක් රජ කාලයේ විසූ අන්දරේගේ පියාටත් " දේවවස්ත්‍රයෙ" ඇතැම් චරිතවලටත් ඇන්දවීම පිළිබඳව සිතා බැලිය යුතුව තිබේ. "පුංචි අන්දරේ" නාට්‍යයේ පසුතල නිර්මාණය මීට වඩා පිළිවෙලකට කළ හැකිව තිබිණ. මුලින්ම වේදිකාවේ වූ පසුතල නිර්මාණය පිළිබඳව එලෙසින් ලියවුණ ද පසුව ඉදිරිපත් වූ පසුතල වඩාත් ආකර්ෂනීය විය. මී ළඟ ඉදිරිපත් කිරීමේ දී දරුවන්ගේ ගායනාවන් ප්‍රේක්ෂකාගාරය පුරා විහිදී යන සේ ඉදිරිපත් කිරීමට ඔවුන් වඩ වඩාත් පුහුණු කරවනු ඇතැයි සිතන්නෙමු.

"දේව වස්ත්‍රය" කථා ආකෘතිය
අපරදිග කථාවක වස්තු බීජයක සේ හැඟුණ ද එකී සිතුවිල්පෙවි මුළුමනින් ම මිදෙන සේ නිර්මාණය කරගන්නා වූ පිටපතකින්ද, නළු" නිළි කැළකගෙන් ද, සංගීතයෙන් ද, අංග සෘචනයෙන්ද යුක්ත වීය. රජුගේ චරිතය රඟ පෑ දයානන්ද ලියනාරච්චිගේ රංගනය සිය සොයුරු කුසුම්සිරි රංගනයන්ට නොදෙවෙනි විය. නාට්‍යයේ මුල සිට අග දක්වා එකලෙසින් රසිකයන් ඒකාග්‍ර කරගැනීමේ කුසලතාවය පිටපතේ පටන් සෑම සියලු අංගයක් දක්වාම පැතිරී ගිය අපූරු ප්‍රහසනයකි මේ. හුදෙක් වචනයෙන් ඇටවූවකට වඩා වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ප්‍රහසනයකි.
ඉහත නාට්‍ය ද්විත්වයේම කැපී පෙනෙන චරිත කිහිපයක් ම වූ අතර ඒවා නම් වශයෙන් මෙහිලා සඳහන් කිරීම අනවශ්‍යයැයි සිතමු. වැඩි හිටි චරිත රඟපෑ සෑම සියලු දෙනම සිය චරිතයට තමාගේ උපරිම දායකත්වය දුන්වග නම් ලිවිය යුතුයි. සෙබල චරිතයක් රඟ පෑ දැරිය පිළිබඳව මෙහිලා වෙසෙසින් ලිවිය යුතු වන්නේ ඇයගේ හඬෙහි ඇති නාට්‍යමය ස්වභාවය ද මෙනෙහි කරමිනි. පිරිමි චරිතයකට පණ පොවමින් සාර්ථකව එම අභියෝගය ජයගත්තීය ඈ. තමන්ට ලැබෙන සුළු චරිතයකින් වුව තම කුසලතාවය උපරිමයෙන් පෙන්වූ අවස්ථාවකි.

ප්‍රහසන යැයි තමන් ම කියා ගන්නා ඇතැම් "ප්‍රහසන" වලට කදිම අතුල් පහරකි "දේව වස්ත්‍රය". තමන් පණ්ඩිත යැයි කියා ගන්නා රජවරුන්ට කුඩා දරුවන් දුන් කදිම පාඩමකි මේ. මෙවන් නාට්‍ය ඉදිරිපත් කරනා මේ සමාජයේ ඒවා නියමාකාරයෙන් විචාරයට ලක් කරන්නෝ ඉතා විරළය හ. එනයින් කුඩා දරුවන් වැනි ප්‍රේක්ෂකයින් තමන්ගේ වින්දන ශක්තියට, දැණුමට අනුව ඉදිරිපත් කරන අදහස් වුවද වැදගත් වෙයි. තමන් උපයන දෙයින් කොටසක් වියදම් කර තමා ලබන අහිංසක වින්දනය පිළිබඳව යමක් ලියා තැබීමට අයිතියක් ද ඇත්තේ ය, ඔවුනට. දැනුම තිබුණු පමණින්ම යමෙකු නුවණැත්තෙකු නොවේ. ඒ දෙකක් මැයි. කුඩා දරුවන්ගෙන් හෝ එවන් රජුනට නුවණැස ලැබේවා ! ය යන්නයි අපගේ ප්‍රාර්ථනය. !

"අපේ සෙල්ලම් ඉස්කෝලේ ", "මල් කැකුළු පොකුරු" වැනි අංග ඉදිරිපත් කිරීමේදී පෙර පටිගත කරන ලද හඬ මනාව බද්ධ වන සේ සිසු සිසුවියන් රංගන ඉදිරිපත් කළහ. ඉතාම කාලෝචිත තේමාවක් රැගත් "අපිට වෙලා තියෙන දේ " වැඩිහිටි අප කාගේත් ඇස් අරවන ළමා රංගනයක් විය. "දේව වස්ත්‍රයේ ළමුන්" යතාර්ථය පෙන්වා දුන් ආකාරය මෙහිදී ද සිහිගැන් විණ.

පෙරහැර අංගයේ වඩාත් සිත් ඇදී ගියේ අංග රචනයට නැතහොත් වෙස්ගැන්වීම්වලටයි. "අලියා" වෙනුවෙන් කදිම ඇඳුමක් නිමවා තිබිණ. දිවන්ගත මාර්ටින් වික්‍රමසිංහයන්ගේ "මඩොල් දූව" ළමා නවකතාව ඇසුරින් කළ නිර්මාණයද සිත් ඇදගන්නා සුළු විය. "සෙල්ලම් ගෙදර", ළමා ගීත, "මාළු යාළු", "මට මෑණී වගේ ",

කලින් වතාවක සේම කාවතා මධ්‍යස්ථානයේ සිංහල භාෂා පාසලේ ආචාර්යවරින් වූ ඉන්දිකා ප්‍රනාන්දු හා පුණ්‍යා පාදුක්කගේ මහත්මීන්ගේ පන්තිවල කුඩා සිසුන් වෙනුවෙන් "අපේ සිරිත් විරිත්" පිළිබඳව කළ ඇමතීම ද සිත සතුටුකරවන්නක් විය. මෙම සටහන් තබන්නේ හුදෙක් ම එවන් ගුරු මෑණිවරුන් හා පියවරුන් ද, එකී දේවලට දරුවන් උනන්දු කරවන දෙමව්පියන් ද තව තවත් ඒ දේ සඳහා උනන්දු කරවීම අරමුණයි. මේ වාරෙ පන් තමන්ගේ සටහන දරුවන් වෙනුවෙන්ම වෙන් කළා.

ඒ මොකද මොන "දේව වස්තරේ" ඇන්දත් කුඩා දරුවන්ගෙන් "නිර්වස්තරේ" හංගන්න බැරි හන්දා.


ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා

Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

DENTIST

Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760

Sannasa